www.agaram.lk

5293

AL/2019/57/S-I(OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

**OLD**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

2019.08.16 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ....................................

| I කොටස | |
|---|---|
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

* I කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* II කොටස – A හා B කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

● නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**1.** ටෙලි නාට්‍යයට අදාළ වරණය තෝරන්න.
(1) අධ්‍යක්ෂවරයෙක් අවශ්‍ය නැත.
(2) ශ්‍රව්‍ය-දෘශ්‍ය කලාවක් ලෙස නො සැලකේ.
(3) සංස්කරණයට වැදගත් තැනක් හිමි නො වේ.
(4) ප්‍රේක්ෂකයන් හා සජීවී ලෙස සම්බන්ධ නො වේ.
(5) ටෙලි නාට්‍යයක් කොටස් වශයෙන් ප්‍රදර්ශනය කළ නොහැකි ය. (.........)

**2.** නෘත්තයට අදාළ **නොවන** වරණය වන්නේ,
(1) අංගචලන ය. (2) වේෂභූෂණ ය. (3) වාද්‍ය වෘන්දය ය.
(4) රංගභූමිය ය. (5) සාත්ත්වික අභිනය ය. (.........)

**3.** නාට්‍ය දර්ශනයක් සාර්ථක වීමට
(1) නළු-නිළියන් හා රංගභූමියක් තිබීම ප්‍රමාණවත් ය.
(2) ආනුෂංගික අංග උපරිම වශයෙන් භාවිත කළ යුතු ය.
(3) නළු-නිළියන් සිය සංවාද වණපොත් කොට තිබීම අවශ්‍ය ය.
(4) රංග කාලය අසීමිත ය.
(5) සියලු ම නළු-නිළියන් ගායනය හා වාදනය ප්‍රගුණ කොට තිබිය යුතු ය. (.........)

**4.** සිනමාවට අදාළ නිවැරදි වරණය තෝරන්න.
(1) ප්‍රේක්ෂකයා හා ප්‍රේක්ෂක ප්‍රතිචාර වැදගත් නො වේ.
(2) 'ප්‍රාසංගික කලාවක්' ලෙස සැලකේ.
(3) පිටපතක් අවශ්‍ය නො වේ.
(4) රූපගත කිරීම කඩින් කඩ කළ නොහැකි ය.
(5) තාක්ෂණය හා දැඩි ලෙස බැඳී ඇත. (.........)

**5.** නවකථාවට අදාළ නිවැරදි වරණය තෝරන්න.
(1) නිර්මාණකරු ගේ පරිකල්පනයට අසීමිත ඉඩක් සැලසේ.
(2) චරිත, සිදුවීම්, කාලය හා අවකාශය සඳහා නාට්‍යයට තරම් නිදහසක් නො ලැබේ.
(3) භාෂාව ප්‍රමුඛ වුව ද සංවාද අන්තර්ගත නො වේ.
(4) චරිත ගොඩනැගීමේ දී බාහිර පෙනුම අවධානයට නො ගැනේ.
(5) ක්ෂණික ප්‍රේක්ෂක ප්‍රතිචාරයට පාත්‍ර වේ. (.........)

[දෙවැනි පිටුව බලන්න.

agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk



**6.** නිදි කුමරිය (The Sleeping Beauty) නම් රුසියානු බැලේ නිර්මාණයට සංගීතය සපයන ලද්දේ,
(1) කෝර්සකොව් විසිනි.
(2) ස්ට්‍රැවින්ස්කි විසිනි.
(3) චයිකොව්ස්කි විසිනි.
(4) මොසාර්ට් විසිනි.
(5) බීතෝවන් විසිනි. (.........)

**7.** වාචික අභිනය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) වාචික අභිනයෙන් තොර ප්‍රාසංගික කලාවක් පැවතිය නොහැකි ය.
(2) වාචික අභිනයට අයත් වන්නේ සංවාද පමණි.
(3) ජනාන්තික, අපවාරිත හා ප්‍රකාශ ආදි භාෂණ විධි වාචිකාභිනයට අයත් නො වේ.
(4) නාට්‍යධර්මී සම්ප්‍රදායේ දර්ශන, පසුතල ආදිය මවා පානුයේ වාචිකාභිනයෙනි.
(5) ලෝකධර්මී සම්ප්‍රදායේ වාචිකාභිනයට වැදගත් තැනක් හිමි නො වේ. (.........)

**8.** සංස්කෘත නාට්‍යයක කක්ෂ්‍යා භාවිතයට අදාළ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සංස්කෘත නාට්‍යයේ කක්ෂ්‍යා වෙන් කරනු ලැබුවේ භෞතික වශයෙනි.
(2) කක්ෂ්‍යා වෙන් කිරීමට සිදු වූයේ පසුතල නිර්මාණ යොදාගැනීම පහසු වනු පිණිස ය.
(3) එක් කක්ෂ්‍යාවක සිටින පිරිස අනෙක් කක්ෂ්‍යාවේ සිටින පිරිස තමනට නොපෙනෙන සේ හැසිරිය යුතු ය.
(4) කක්ෂ්‍යා වෙන් කරනු ලැබුවේ රංගෝපකරණ භාවිතයෙනි.
(5) අභිඥානශාකුන්තලයේ කක්ෂ්‍යා විභාගය අනුගමනය නො කෙරේ. (.........)

**9.** ග්‍රීක නාට්‍යරචක සොෆොක්ලීස් පිළිබඳ නිවැරදි වරණය තෝරන්න.
(1) අවුරුදු 80ක් ජීවත් විය.
(2) උපත ලැබුවේ ක්‍රි.පූ. 497 දී ය.
(3) කිසි විටෙක තම නාට්‍යයකට ප්‍රථම ස්ථානය හිමි කරගත්තේ නැත.
(4) ගායන වෘන්දය දොළොසක් දක්වා අඩු කළේ ය.
(5) ජ්‍යෙෂ්ඨතම ග්‍රීක ශෝකාත්ම නාට්‍ය රචකයා ය. (.........)

**10.** ග්‍රීක ශෝකාත්ම නාට්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ග්‍රීක ශෝකාත්මයක ආකුලීකරණය යනු සිදුවීම් පැහැදිලි වීම යි.
(2) ග්‍රීක ශෝකාත්මයක ඛේදනීය වීරයා දුර්භාග්‍යයේ සිට සෞභාග්‍යය කරා ගමන් ගනී.
(3) මූලාශ්‍රය කොටගන්නා පුරාකථාව ඒ අයුරින් ම ඉදිරිපත් කෙරේ.
(4) ඇරිස්ටෝටල් ගේ කාව්‍යශාස්ත්‍රය සම්පාදනය වන විට ශ්‍රේෂ්ඨතම ග්‍රීක ශෝකාත්ම නාටක රචනා වී අවසාන ය.
(5) පෞර දියොනීසියා උත්සවයට ඉදිරිපත් කරන ලද්දේ ශෝකාත්ම නාටක පමණි. (.........)

- පහත සඳහන් මාතෘකා අධ්‍යයනය කොට අංක **11 - 15** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - උත්ථානය | F - කොකත | K - ස්ටැනිස්ලව්ස්කි |
| B - පුෂ්කදෙන් | G - ගෙත්සෙමනි උද්‍යානය | L - කන්ජින්චෝ |
| C - ඇන්ටන් චෙකොෆ් | H - හෙන්රික් ඉබ්සන් | M - ඉයුජීන් අයනෙස්කෝ |
| D - නෙම්බුත්සු ඔදොරි | I - ගොඩෝ එනකං | N - ජූදාස් |
| E - සැමුවෙල් බෙකට් | J - මචරි බූතයි | O - දෝජෝ විහාරය |

**11.** යථාර්ථවාදී නාට්‍ය කලාවට අදාළ වන්නේ,
(1) C, E හා M ය. (2) C, H හා M ය. (3) C, H හා K ය. (4) E, H හා M ය. (5) H, J හා M ය. (.........)

**12.** මධ්‍යකාලීන ජනවන්දනා නාට්‍යයට අදාළ වන්නේ,
(1) A, G හා L ය. (2) A, G හා N ය. (3) C, M හා O ය. (4) D, I හා N ය. (5) E, G හා N ය. (.........)

**13.** නෝ නාට්‍යයට අදාළ වන්නේ,
(1) A, I හා M ය. (2) B, F හා O ය. (3) B, G හා O ය. (4) D, F හා L ය. (5) D, I හා O ය. (.........)

**14.** කබුකි නාට්‍යයට අදාළ වන්නේ,
(1) A, F හා K ය. (2) B, F හා O ය. (3) D, G හා L ය. (4) D, J හා L ය. (5) F, L හා O ය. (.........)

**15.** අසම්මත නාට්‍ය කලාවට අදාළ වන්නේ,
(1) B, G හා L ය. (2) D, E හා N ය. (3) E F හා H ය. (4) E, H හා M ය. (5) E, I හා M ය. (.........)

[තුන්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

5293



**16.** පහත සඳහන් පාරිභාෂික පද අතුරෙන් කබුකි රඟ හලකට අදාළ **නොවන** පදය තෝරන්න.
(1) හනමිචි (2) සෙරි අගෙ (3) කකිවරි
(4) කුමදොරි (5) මවරිබුතයි (.........)

**17.** කබුකි නාට්‍යයක ස්ත්‍රී චරිත සඳහා අදාළ නොවන පදය තෝරන්න.
(1) තයූ (2) අකුබෙ (3) වක ඔන්නගත
(4) මුසුමෙගත (5) ඔතොකොගත (.........)

● **18** සිට **22** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**18.** "ද පබ්ලික් එනිමි" නාට්‍යය "ජන හතුරා" නමින් සිංහලයට පරිවර්තනය කළේ කවරෙක් ද?
(1) ජයලත් මනෝරත්න (2) සුනන්ද මහේන්ද්‍ර (3) ආරිය රාජකරුණා
(4) පියදාස නිශ්ශංක (5) කේ.ජී. කරුණාතිලක (.........)

**19.** රංජිත් ධර්මකීර්ති සිංහලයට පරිවර්තනය කළ "හිරු නැති ලොව" නාට්‍යයේ මුල් කෘතිය වන්නේ,
(1) ද ලීග් ඔෆ් යූත් ය. (2) ද වයිල්ඩ් ඩක් ය.
(3) ද ලෝවර් ඩෙප්ත්ස් ය. (4) අවර් ටවුන් ය.
(5) ද ගෝස්ට් ය. (.........)

**20.** 'දි ඇපල් කාට්' නාට්‍යයේ රචකයා වන්නේ,
(1) බර්නාඩ් ෂෝ ය. (2) ටෙනසී විලියම්ස් ය. (3) හෙන්රික් ඉබ්සන් ය.
(4) මැක්සිම් ගෝර්කි ය. (5) සැමුවෙල් බෙකට් ය. (.........)

**21.** ටෙනසී විලියම්ස් ගේ 'අ කැට් ඔන් අ හොට් ටින් රූෆ්' නාට්‍යයේ සිංහල පරිවර්තනයේ නම කුමක් ද?
(1) හෙලේ නැග්ග ඩෝං පුතා (2) හිත හොඳ අම්මණ්ඩි
(3) හරි ම බඩු හයක් (4) හිරු නැති ලොව
(5) අපේ ම දරුවෝ (.........)

**22.** ධර්මසිරි බණ්ඩාරනායක ගේ "මකරාක්ෂයා" නාට්‍යයේ මුල් කෘතියේ රචකයා වන්නේ,
(1) ඉයුජින් අයනෙස්කෝ ය. (2) ඇන්ටන් චෙකොෆ් ය.
(3) අර්වින් පිස්කැටෝර් ය. (4) ලුයිජි පිරැන්ඩෙලෝ ය.
(5) එව්ගිනි ෂ්වාත්ස් ය. (.........)

agaram.lk

● ප්‍රශ්න අංක **23** සිට **36** තෙක් වන ප්‍රශ්නවලට අදාළ වඩාත් නිවැරදි ප්‍රකාශයට අයත් අංකය වරහන තුළ යොදන්න.

**23.** ග්‍රීක නාට්‍ය සම්ප්‍රදායේ,
(1) ශෝකාත්ම නාට්‍යයක අධ්‍යක්ෂවරයා හැඳින්වූයේ බොරීගොස් නමිනි.
(2) පෞර දියොනීසියා උළෙලට සටුර නාටක ඉදිරිපත් නො විණි.
(3) සියලු ම ග්‍රීක නාට්‍ය ගද්‍යයෙන් රචනා වී ඇත.
(4) ග්‍රීක ශෝකාත්ම නාටක බොහෝමක් රචනා වී ඇත්තේ පශ්චාද් දෘෂ්ටිමය කථන ක්‍රමයට ය.
(5) ග්‍රීක ශෝකාත්ම නාට්‍යවලට අදාළ භාව අටක් පිළිබඳ ව ඇරිස්ටෝටල් සඳහන් කොට ඇත. (.........)

**24.** සංස්කෘත නාට්‍යයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සංස්කෘත නාට්‍යයේ ප්‍රභවය පිළිබඳ ව කිසිදු මතවාදයක් පළ වී නැත.
(2) මනුෂ්‍යයන් සඳහා වන නාට්‍යගෘහය දිගින් සූසැට රියනක් හා පළලින් දෙතිස් රියනක් විය.
(3) රංග කාර්යය සඳහා කිසිදු පූර්ව සූදානමක් අවශ්‍ය නො වී ය.
(4) 'ස්වප්නවාසවදත්තය' කාලිදාස ගේ නිර්මාණයකි.
(5) කිසිදු භාරතීය රජ කෙනෙක් සංස්කෘත නාට්‍ය රචනා කොට නැත. (.........)

**25.** මධ්‍යකාලීන යුරෝපීය නාට්‍ය කලාවට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මධ්‍යකාලීන යුරෝපයේ සියලු නාට්‍ය පල්ලිය තුළ පමණක් රඟ දැක්විණි.
(2) නළු-නිළියන් ලෙස සහභාගී වූයේ පූජකවරුන් පමණකි.
(3) 'ද මිස්ටරි ඔෆ් ඇඩම්' පැරණිතම මිස්ටරි (අද්භූත) නාටකය ලෙස සැලකේ.
(4) කිසිදු මධ්‍යකාලීන නාට්‍යයක් අනුවර්තනයක් හෝ පරිවර්තනයක් ලෙසින් සිංහල බසට නැඟී නැත.
(5) ඉංග්‍රීසි චක්‍රනාටක සඳහා බයිබල් කථා පුවත් පදනම් වූයේ නැත. (.........)

[හතරවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**26.** එළිසබෙතීන නාට්‍යයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) රෝම නාට්‍යයෙන් ආභාසය ලබා නැත.
(2) එළිමහන් වේදිකාවක රාත්‍රි කාලයේ රංගගත විය.
(3) විලියම් ශේක්ස්පියර් විසින් රචනා කරනලද්දේ ශෝකාත්ම නාටක පමණි.
(4) මා(ර්)ලෝ, ලයිලි හා බර්නාඩ් ෂෝ ශේක්ස්පියර්ගේ සමකාලීනයෝ වූහ.
(5) ක්‍රි.ව. 1558-1603 අතර කාලය එළිසබෙතීන යුගයයි. (.........)

**27.** 'නෝ' නාට්‍යයට අදාළ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) 'නෝ' නාට්‍ය ප්‍රභවය වූයේ පන්සල් භූමියේ ජනප්‍රිය රැඟුමක විලාසයෙනි.
(2) 'සුමිද නදිය' හා 'ෂිබරකු' ප්‍රසිද්ධ 'නෝ' නාට්‍ය දෙකකි.
(3) වෙස්මුහුණු භාවිත වූයේ ස්ත්‍රී, යක්ෂ හා අවතාර සඳහා පමණි.
(4) ප්‍රේක්ෂාගාරය හා ප්‍රධාන වේදිකාව තිරයකින් වෙන් වේ.
(5) 'නෝ' රංගභූමියේ ක්‍යෝගන් නාට්‍ය රඟ දැක්වන්නේ නැත. (.........)

**28.** නාට්‍ය සංගීතයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍ය සංගීතය වශයෙන් විශේෂයෙන් වෙන් කොට හඳුනාගන්නා සංගීතයක් නැත.
(2) සංගීත නිර්මාණකරුවා නාට්‍ය පෙළ අධ්‍යයනය කොට තිබීම අවශ්‍ය නො වේ.
(3) අධ්‍යක්ෂවරයා පෙළට දෙන අර්ථකථනය සංගීතයෙන් පෝෂණය විය යුතු ය.
(4) සංගීතය අවශ්‍ය වන්නේ නාට්‍යධර්මී සම්ප්‍රදායට පමණි.
(5) හොඳ නාට්‍යයක සංගීතය නාට්‍ය අබිබවා මතු විය යුතු ය. (.........)

**29.** වේදිකා තිර භාවිතයට අදාළ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ප්‍රොසීනියම් රඟහලක ප්‍රධාන තිරය පිහිටා ඇත්තේ උඩු වේදිකාවේ පසු පසට වන්නට ය.
(2) වේදිකාව හා ප්‍රේක්ෂාගාරය වෙන් කෙරෙනුයේ අහස් තිරයෙනි.
(3) ප්‍රොසීනියම් රඟහලක පැති තිරවලින් කිසිදු කාර්යයක් ඉටු නො වේ.
(4) පටී, අපටී, තිරස්කරිණී, යවනිකා යනු තිර සඳහා භාවිත පර්යාය ශබ්ද වේ.
(5) ඕනෑ ම නාට්‍ය සම්ප්‍රදායක තිර භාවිතය එක ම ආකාරයක් ගනී. (.........)

**30.** රංග වින්‍යාසයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) රංග වින්‍යාසය යනු මිනිස් ක්‍රියා, අවකාශය හා ආනුෂංගිකාංග සුසංයෝගයෙන් ගොඩනැගෙන්නකි.
(2) මෙය අවශ්‍ය වන්නේ නාට්‍යධර්මී සම්ප්‍රදායට පමණි.
(3) වේදිකාව මත නළු-නිළියන් පෙළ ගැස්වීම යි.
(4) නාට්‍යයේ අන්තර්ගත නර්තනාංග ක්‍රමානුකූල ව සැකසීම යි.
(5) මෙය පෙරදිග ව්‍යවහාරයකි. (.........)

**31.** රංගභූමි අලංකරණයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මෙය විචිත්‍ර ප්‍රේක්ෂාවකට බාධාවකි.
(2) ගද්‍ය හෝ පද්‍ය සංවාද මගින් රංගභූමි අලංකරණ ප්‍රේක්ෂක මනසේ මවා පෑමට හැකි ය.
(3) රංගභූමි අලංකරණයට ආලෝකය සම්බන්ධ නැත.
(4) නාට්‍ය පෙළෙහි මීට අදාළ කිසිවක් සඳහන් ව නැත.
(5) යථාර්ථවාදී නාට්‍ය රීතිය හඳුන්වාදීමත් සමග ම රංගභූමි අලංකරණ නොවැදගත් බවට පත් විය. (.........)

**32.** රංගාලෝකයට අදාළ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) වේදිකාවේ භෞතික පිහිටීම රංගාලෝක ශිල්පියාට වැදගත් නො වේ.
(2) වේදිකාව පුරා විසිරෙන ආලෝකය නිකුත් වන්නේ යොමු පහනෙනි.
(3) වේදිකා නාට්‍ය සඳහා වර්ණ චක්‍රය භාවිත නො වේ.
(4) ප්‍රයෝග සහ දර්ශක ප්‍රක්ෂේපණ ආලෝක පහන් ගණයට නො වැටේ.
(5) වේදිකාවේ භාවිත අලෝක පහන් හැඳින්වීමට සංකේත අංකයක් ඇත. (.........)

**33.** නාට්‍ය අධ්‍යක්ෂණයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍ය අධ්‍යක්ෂවරයකුට අවශ්‍ය වන්නේ නායකත්වය සැපයීමේ හැකියාව පමණි.
(2) සමස්ත රංගයේ සාර්ථකත්වය ඔහු ගේ වගකීමක් නො වේ.
(3) කොන්ස්ටාන්ටින් ස්ටැනිස්ලව්ස්කි අධ්‍යක්ෂක ගේ කාර්ය ලිහිල් කළේ ය.
(4) සංස්කෘත නාට්‍යයේ අධ්‍යක්ෂ සූත්‍රධාර නම් විය.
(5) නාට්‍ය අධ්‍යක්ෂවරයා ආඥාදායකයකු මෙන් ක්‍රියා කළ යුතු ය. (.........)

[පස්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**34.** ස්වාභාවිකවාදී සම්ප්‍රදායට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ස්වාභාවිකවාදී සම්ප්‍රදායේ රූපණයට වඩා පසුතලය වැදගත් විය.
(2) ස්වාභාවිකවාදය හා යථාර්ථවාදය අතර වෙනසක් ඇත.
(3) 'තෙරේස් රැක්වින්' ස්වාභාවිකවාදයට අනුගත ව කළ නිර්මාණයකි.
(4) මෙය විසිවන සියවසේ භාවිතයට ආ නාට්‍ය රීතියකි.
(5) මෙය හඳුන්වාදෙනු ලැබුයේ ලුයිජි පිරන්ඩෙලෝ විසිනි. (.........)

**35.** යථාර්ථවාදී රංග රීතියට අදාළ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) විද්‍යාත්මක චින්තනය, කාර්මික විප්ලවය, නව බුද්ධිමය ප්‍රබෝධය හේතු විය.
(2) මනුෂ්‍ය ස්වභාවයේ දෘශ්‍යමාන ස්වරූපය නිරූපණය කිරීම මේ මගින් සිදු වේ.
(3) මුල්වරට හඳුන්වාදෙනු ලැබුවේ දහඅට වන සියවසේ ය.
(4) බර්නාඩ් ෂෝ මෙම රීතියට පටහැනි විය.
(5) මෙම රීතිය මගින් තත්ත්වානුරූපී මායාව ප්‍රතික්ෂේප කෙරේ. (.........)

**36.** රොමැන්ටික් රංග රීතියට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ජර්මානු ජාතික ග'තේ මෙම රීතිය ප්‍රතික්ෂේප කළේ ය.
(2) බුද්ධිවාදයට එරෙහිව යුරෝපා රටවල පැනනැගි රීතියකි.
(3) මෙම රීතියේ පරිකල්පනයට ඉඩක් නැත.
(4) හේතුඵල සම්බන්ධ මූලික වශයෙන් ආරක්ෂා කෙරෙන රීතියකි.
(5) භාවයට වඩා වැඩි තැනක් බුද්ධියට හිමි වේ. (.........)

**37.** සංස්කෘත නාට්‍යයේ ප්‍රේක්ෂාගෘහය සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) රංගපීඨ හා රංගශීර්ෂ යනු නළුවන් සඳහා වෙන් වුණු කොටස් වේ.
(2) භරතමුනි විසින් විරචිත නාට්‍යශාස්ත්‍රයේ මේ පිළිබඳ ව දීර්ඝ ලෙස විස්තර වේ.
(3) ජ්‍යෙෂ්ඨ නාට්‍යගෘහය දෙවියන් සඳහා නිර්මාණය විය.
(4) ජ්‍යෙෂ්ඨ, මධ්‍යම හා අවර වශයෙන් ප්‍රේක්ෂාගෘහ වර්ග තුනක් විය.
(5) සංස්කෘත නාට්‍යයේ කිසිදු ආකාරයක තිර භාවිතයක් නො වී ය. (.........)

**38.** අභිඥානශාකුන්තලයේ දෙවැනි අංකයේ තාපසයන් තපෝවනය ආරක්ෂා කරන ලෙස දුෂ්‍යන්ත ගෙන් ඉල්ලාසිටීම අයත් වන්නේ කවර අර්ථප්‍රකෘතියට ද?
(1) කාර්ය
(2) බින්දු
(3) පතාකා
(4) බීජ
(5) ප්‍රකරී (.........)

**39.** එළිසබෙතීන යුගයේ ග්ලෝබ් රඟහලේ වේදිකාව අයත් වන්නේ මින් කුමන වර්ගයකට ද?
(1) විවෘත එළිමහන්
(2) චක්‍රාකාර
(3) වෘත්තාකාර
(4) ඒප්‍රනාකාර
(5) අර්ධ මණ්ඩල (.........)

**40.** යථාර්ථවාදී නාට්‍ය සඳහා වඩාත් සුදුසු වේදිකාව වන්නේ,
(1) ප්‍රාසාදමුඛ
(2) ප්‍රක්ෂිප්ත
(3) ප්‍රොසීනියම්
(4) බ්ලැක් බොක්ස්
(5) විකෘෂ්ට (.........)

* *



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

II කොටස

**උපදෙස්:**

* **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

## A කොටස

1. (i) නර්තනයට ප්‍රමුඛත්වය හිමි වන ප්‍රාසංගික කලා ප්‍රභේද **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි.)
(ii) ඉහත (i) හි සඳහන් කරන ලද **එක්** ප්‍රභේදයක ආරම්භය හා විකාශය විස්තර කරන්න. (ලකුණු 05 යි.)
(iii) ඉහත (i) හි සඳහන් කරන ලද කලා ප්‍රභේද නාට්‍ය කලාව හා සංසන්දනය කරන්න. (ලකුණු 06 යි.)

2. (i) සාත්ත්වික භාව **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි.)
(ii) ඉහත (i) හි සඳහන් කරන ලද ඒවායින් **දෙකක්** පැහැදිලි කොට දක්වන්න. (ලකුණු 04 යි.)
(iii) වේදිකා නාට්‍යයක සාත්ත්වික භාව කෙසේ ප්‍රයෝජනයට ගත හැකි දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 07 යි.)

3. (i) වේදිකා නාට්‍යයක ප්‍රේක්ෂාව මැවීමට හේතු වන ආනුෂංගිකාංග **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05 යි.)
(ii) ඉහත (i) හි සඳහන් කරන ලද අංග **දෙකක්** පිළිබඳ නිදසුන් සහිත විස්තරයක් කරන්න. (ලකුණු 05 යි.)
(iii) නාට්‍යධර්මී ශෛලියේ නාට්‍යයක ප්‍රේක්ෂාව පිළිබඳ විමර්ශනයක් කරන්න. (ලකුණු 05 යි.)

## B කොටස

4. (i) ග්‍රීසියේ එළිමහන් රංග භූමියක කටු සටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න. (ලකුණු 04 යි.)
(ii) ග්‍රීක ශෝකාත්ම නාට්‍යයේ වේෂභූෂණ පිළිබඳ ව විස්තරයක් කරන්න. (ලකුණු 05 යි.)
(iii) සොෆොක්ලීස් ගේ සමයේ ශෝකාත්ම නාට්‍යයක ගායන වෘන්දයේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

5. (i) යථාර්ථවාදී රංග රීතියට සුවිශේෂ මෙහෙවරක් කළ පුරෝගාමී නාට්‍යකරුවන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 03 යි.)
(ii) අපරදිග රංග කලාව විෂයයෙහි ඉහත (i) හි සඳහන් කරන ලද නාට්‍යකරුවන් ගේ මෙහෙවර අගයන්න. (ලකුණු 06 යි.)
(iii) යථාර්ථවාදී රංග රීතියෙන් බැහැර ව නව රංග රීතියක් හඳුන්වාදුන් නාට්‍යකරුවකු හඳුන්වා, ඔහු ගේ රංග රීතිය පිළිබඳ විමර්ශනයක් කරන්න. (ලකුණු 06 යි.)

6. (i) චරිත පදනම් කොට 'නෝ' නාට්‍ය වර්ග කොට ඇති ආකාරය දක්වන්න. (ලකුණු 05 යි.)
(ii) 'නෝ' නාට්‍යයේ නළු වර්ග හඳුන්වා දී ඒ පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05 යි.)
(iii) 'නෝ' රංග ශෛලිය පිළිබඳ විමර්ශනයක් කරන්න. (ලකුණු 05 යි.)

* * *

Agaram.LK - Keep your dreams alive!
මෙතැනින් කපන්න
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

5293

AL/2019/57/S-II(OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

නාට්‍ය හා රංග කලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

2019.08.17 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ..................................

| | |
|---|---|
| I කොටස | |
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

* I කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* II කොටස – A හා B කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

* එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **වරහන තුළ** ලියන්න.

**1.** පහතරට ප්‍රදේශවලට ආවේණික ශාන්තිකර්ම අන්තර්ගත වරණය තෝරන්න.
(1) ගම්මඩුව, දෙවොල් මඩුව, කුමාර සමයම
(2) මැණික්පාල ශාන්තිය, රට යකුම, කොහොඹා යක්කම
(3) කඩවර කංකාරිය, කැලෑ යකුම, කිරිකොරහ ශාන්තිය
(4) සන්නියකුන් යාගය, රිද්දි යාගය, සූනියම් යාගය
(5) ගරා යකුම, මහසොහොන් යාගය, පහන් මඩුව (.........)

**2.** කොහොඹා කංකාරියේ පූජාවට පාත්‍රවන දේව/යක්ෂ කොට්ඨාශ අන්තර්ගත වරණය තෝරන්න.
(1) නාථ, පත්තිනි, දැඩිමුණ්ඩ
(2) ඉරුගල් බණ්ඩාර, කන්දේ බණ්ඩාර, වීරමුණ්ඩ
(3) කඩවර, මෙලෙහි යකුන්, රීරි යකා
(4) දෙවොල්, මහසෝනා, කළු කුමාර
(5) වැදි යකා, කොහොඹා යකුන්, දෙවොල් දෙවි (.........)

**3.** සන්නියකුම යාගයට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) ගර්භ සංරක්ෂණ ශාන්තිකර්මයකි.
(2) යක් බෙරය හා ගැට බෙරය භාවිත වේ.
(3) යාගයට සහභාගී වන යාග ඇදුරන් වෙස්මුහුණු පළඳින්නේ නැත.
(4) නවමාලේ මල්බලිය රංග භූමි අලංකරණයක් ලෙස භාවිත වේ.
(5) සූනියම් යක්ෂිණිය වේශ තුනකින් රඟමඩලට පිවිසේ. (.........)

[දෙවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



- පහත දැක්වෙන වෙස්මුහුණු අධ්‍යයනය කොට අංක **4** සිට **9** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ඡායාරූපවලට දී ඇති ඉංග්‍රීසි අක්ෂරය ප්‍රශ්නය ඉදිරියේ ඇති හිස් තැන තුළ යොදන්න.




A B C D E F

**4.** 'A' අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) කණ සන්නියේ මුහුණයි.
(2) හේවා කෝලමේ මුහුණයි.
(3) පොලිස් කෝලමේ මුහුණයි.
(4) පිස්සු සන්නියේ මුහුණයි.
(5) නාග රාක්ෂ මුහුණයි. (.........)

**5.** 'B' අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) අමුක්කු සන්නි මුහුණයි.
(2) නොංචි කෝලමේ මුහුණයි.
(3) ලෙංචිනාගේ මුහුණයි.
(4) බිහිරි සන්නි මුහුණයි.
(5) ගොළු සන්නි මුහුණයි. (.........)

**6.** 'C' අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) ජස කෝලමේ මුහුණයි.
(2) කෝල සන්නි මුහුණයි.
(3) මුදලි කෝලමේ මුහුණයි.
(4) නාග සන්නි මුහුණයි.
(5) අමුක්කු සන්නියේ මුහුණයි. (.........)

**7.** 'D' අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) ජස කෝලමේ මුහුණයි.
(2) කොර සන්නි මුහුණයි.
(3) අණබෙර කෝලමේ මුහුණයි.
(4) දෙමළ සන්නි මුහුණයි.
(5) ගිනි සන්නි මුහුණයි. (.........)

**8.** 'E' අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) ජෝඩි කෝලමේ මුහුණයි.
(2) කොර සන්නියේ මුහුණයි.
(3) සූනියම් යක්ෂිණියගේ මුහුණයි.
(4) මුර්තු සන්නි මුහුණයි.
(5) ජස කෝලමේ මුහුණයි. (.........)

**9.** 'F' අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) කණ සන්නි මුහුණයි.
(2) හේවා කෝලමේ මුහුණයි.
(3) පිත් සන්නි මුහුණයි.
(4) ගිනි සන්නි මුහුණයි.
(5) පොලිස් කෝලමේ මුහුණයි. (.........)

**10.** ශ්‍රී ලංකාවේ මඩු ශාන්තිකර්මවලට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) මඩු ශාන්තිකර්ම සබරගමු සම්ප්‍රදායට පමණක් අයත් ය.
(2) ප්‍රධාන වශයෙන් පූජා ලබන්නේ මංගර දෙවියා ය.
(3) මඩු ශාන්තිකර්මවල නාටකීය අවස්ථා විරල ය.
(4) රෝග නිවාරණය, සෞභාග්‍යය හා සශ්‍රීකත්වය අපේක්ෂා කෙරේ.
(5) මඩු ශාන්තිකර්ම පවත්වන්නේ දාරක සම්පත් අපේක්ෂාවෙනි. (.........)

**11.** ශ්‍රී ලංකාවේ බෞද්ධ පූජාකර්මවලට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත පූජාකර්ම අතීතයේ දී පවත්වනු ලැබුවේ විහාරාශ්‍රිත ව ය.
(2) සමාරෝපය හැර අනුකරණය, අනුරූපණය ආදි ලක්ෂණ ඒවායේ අන්තර්ගත විය.
(3) යුගාසන බණ දේශනා කරන ලද්දේ නළු යුවලක් විසිනි.
(4) දොරකඩ අස්න නාට්‍යමය ලක්ෂණයෙන් විහීන වූවකි.
(5) වර්තමානය වන විට නාට්‍යමය ලක්ෂණ රැගත් කිසිදු බෞද්ධ පූජාකර්මයක් නො පැවැත්වේ. (.........)

[තුන්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**12.** 'කෝලම් සම්ප්‍රදායට' අදාළ නිවැරදි වරණය තෝරන්න.
(1) වෙස්මුහුණු පලඳිනු ලැබුවේ ස්ථාවර පාත්‍රයන් විසින් පමණි.
(2) නාට්‍යය මෙහෙයවනු ලබන්නේ කාරියකරවනරාළ විසිනි.
(3) නිශ්චිත රංග ආකෘතියක් නොමැත.
(4) කරළිය නම් ස්ථානයක රඟ දැක්විණි.
(5) හාස්‍යයට ප්‍රමුඛත්වයක් නො ලැබේ. (………)

**13.** 'නාඩගමට' අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) නාඩගම සඳහා හින්දුස්ථානි සංගීතය භාවිත විය.
(2) පූර්වරංගයක් තිබුණ ද ඊට ස්ථාවර පාත්‍රයෝ සහභාගි නොවූණහ.
(3) යුරෝපීය ජන වන්දනා නාට්‍යවල ආභාසය ලබා ප්‍රභවය වූ බවට මතවාදයක් පවතී.
(4) ඇහැළේපොළ නාඩගම චාල්ස් ඩයස් ගේ නිර්මාණයකි.
(5) නාඩගම ව්‍යාප්ත වූයේ කෝලම් සම්ප්‍රදාය ව්‍යාප්ත වූ ප්‍රදේශවල ය. (………)

**14.** 'නූර්තියට' අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) දේශීය නාට්‍ය කලාවට නූර්තියෙන් කිසිදු ආභාසයක් නො ලැබිණි.
(2) නූර්තිය ශ්‍රී ලංකාවේ ප්‍රචලිත වීමට කිසිදු විදේශීය සම්ප්‍රදායක් මුල් වූයේ නැත.
(3) නූර්ති රඟ දැක්වූයේ විවෘත එළිමහන් වේදිකාවක ය.
(4) රාත්‍රි කාලයක් මුළුල්ලේ රඟ දැක්විණි.
(5) මාකලන්දාවගේ ජෝන් ද සිල්වා නූර්ති නිර්මාණකරුවෙකි. (………)

**15.** 'ටීටර් නාට්‍යයට' අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) රොඩී කෙල්ල, විධුර හා පිටිසර කෙල්ල ටීටර් නාට්‍ය වේ.
(2) යථාර්ථවාදී නාට්‍ය කලාවකි.
(3) වීදි නාට්‍ය විශේෂයකි.
(4) ස්ත්‍රීන් රඟපෑමෙන් දායක වූයේ නැත.
(5) දීර්ඝ කාලයක් ජනප්‍රිය ව පැවතිණි. (………)

**16.** 'මිනර්වා නාට්‍ය' සම්බන්ධ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) විදග්ධ නාට්‍ය සම්ප්‍රදායක් ලෙස හැඳින්වේ.
(2) සංකීර්ණ රංග රීතියක් අනුගමනය කරන ලදී.
(3) ප්‍රධාන ස්ත්‍රී චරිතය රඟපාන ලද්දේ රුක්මණීදේවි විසිනි.
(4) නූර්තිය හඳුන්වා දීමට පූර්වයෙන් බිහි වූ සම්ප්‍රදායකි.
(5) විවෘත අවකාශයක රංගගත විය. (………)

**17.** ආදි විශ්වවිද්‍යාලයීය නාට්‍ය සම්බන්ධ **වැරදි** ප්‍රකාශය කුමක් ද?
(1) ලංකා විශ්වවිද්‍යාලයීය නාට්‍ය සංගමය ආරම්භ වූයේ 1933 දී ය.
(2) විදේශීය නාට්‍ය රසක් මේ යුගයේ ලාංකේය වේදිකාව සඳහා නිර්මාණය විණි.
(3) ලුඩොවයික් ගෙන් පසු ඔහුගේ ශිෂ්‍යයෝ දේශීය නාට්‍ය කලාවේ පෝෂණයට දායක වූහ.
(4) මාර්කෝ මිලියන්ස්, ඇන්ඩ්‍රොක්ලීස් ඇන්ඩ් ද ලයන් ලුඩොවයික්ගේ නිෂ්පාදන විය.
(5) විශ්වවිද්‍යාල කොලීජියේ නාට්‍ය සංගමයට ඊ.එෆ්.සී. ලුඩොවයික් දායක වූයේ නැත. (………)

**18.** ලංකා විශ්වවිද්‍යාලයේ සිංහල සමිතියේ නාට්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ලංකා විශ්වවිද්‍යාලයීය සිංහල සමිතිය ආරම්භ වන්නේ 1950 දී ය.
(2) සිංහල සමිතියේ නාට්‍යවලට ඇන්ටන් චෙකොෆ්ගේ නාට්‍ය අයත් නො විණි.
(3) විශ්වවිද්‍යාලීය සිංහල සමිතිය නිෂ්පාදනය කළේ ස්වතන්ත්‍ර නාට්‍ය පමණි.
(4) එදිරිවීර සරච්චන්ද්‍රයන් ස්වතන්ත්‍ර නාට්‍ය කිසිවක් රචනා කොට නැත.
(5) එදිරිවීර සරච්චන්ද්‍ර කලක් සිංහල සමිතිය සමග වැඩ කළේ ය. (………)

**19.** ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය කලාව සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) පාස්කු නාට්‍ය චරිත සඳහා කිසි විට රූකඩ භාවිත නො විණි.
(2) පැරණිතම පාස්කු නාට්‍යය පේසාලේ නම් ග්‍රාමයේ ආරම්භ වී ඇත.
(3) පාස්කු නාට්‍ය ආරම්භ වන්නේ යේසුතුමන් කුරුසිපත් කරන අවස්ථාවෙනි.
(4) ලෝකධර්මී ශෛලියට අනුගත ව රඟ දැක්වේ.
(5) පාස්කු නාට්‍ය රඟ දැක්වීමට විශේෂ ප්‍රේක්ෂාගෘහයක් පවතී. (………)

[හතරවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



- පහත සඳහන් මාතෘකා අධ්‍යයනය කොට අංක **20 - 25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| A - වඩමෝඩි | G - වෙල්ලකට්ටර |
| B - මන්මදන් | H - සූරන් පෝ |
| C - කලරි | I - තෙන්මෝඩි |
| D - විෂ්ණු | J - තිරුවිලා |
| E - විජයතසම් | K - නරකාසුර |
| F - සංකරම් | L - නාටක අරංකන් කල්ලූරි |

**20.** නාට්ටුකුත්තු සම්ප්‍රදායේ ප්‍රභේද **දෙකක්** වන්නේ,
(1) A හා I ය. (2) A හා F ය. (3) F හා I ය. (4) H හා I ය. (5) H හා K ය. (.........)

**21.** දීපාවලී උත්සවය හා සම්බන්ධ වන්නේ,
(1) B හා K ය. (2) D හා G ය. (3) D හා K ය. (4) E හා L ය. (5) F හා G ය. (.........)

**22.** වඩමෝඩියේ වේදිකාව හා සම්බන්ධ වන්නේ,
(1) C හා E ය. (2) C හා G ය. (3) E හා F ය. (4) E හා G ය. (5) F හා I ය. (.........)

**23.** කාමන්කුත්තු හා සම්බන්ධ වන්නේ,
(1) B හා G ය. (2) B හා J ය. (3) C හා I ය. (4) F හා I ය. (5) F හා K ය. (.........)

**24.** නවරාත්‍රි මංගල්‍යය හා සම්බන්ධ වන්නේ,
(1) B හා G ය. (2) C හා E ය. (3) D හා J ය. (4) E හා H ය. (5) G හා K ය. (.........)

**25.** එස්. මෞනගුරු හා සම්බන්ධ වන්නේ,
(1) A හා K ය. (2) E හා H ය. (3) F හා J ය. (4) F හා L ය. (5) H හා K ය. (.........)

**26.** "බොරු ඇතා පස්සේ දුවගෙන ගිය උදයන රජු මිරිඟුවක් සොයාගෙන වල්මත් වුණු මුව ධේනුවකට සමාන කරන්න මට හිතුණා"
හස්තිකාන්ත මන්තරේ නාට්‍ය පෙළෙහි සඳහන් ඉහත සංවාද ඛණ්ඩය කවුරුන් විසින් කියන ලද්දක් ද?
(1) රේරුක (2) බන්ධුල (3) වෙළෙන්දා (4) පජ්ජෝත රජු (5) බිසව (.........)

**27.** හස්තිකාන්ත මන්තරයට අදාළ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) හෙන්රි ජයසේන හා මානෙල් ජයසේන මුල් නාට්‍යයේ රඟ පා ඇත.
(2) දේශීය මූලාශ්‍රයක් පාදක කොටගත්තකි.
(3) නාඩගම් ශෛලියට අනුව රඟ දක්වා ඇත.
(4) පළමු වරට රඟ දක්වා ඇත්තේ 1959 නොවැම්බර් මාසයේ ය.
(5) නාට්‍යයේ රංග විධාන අන්තර්ගත ව නැත. (.........)

**28.** "බක්මීවැවේ අදිකාරම දනී මම අංග ලක්ෂණ ශාස්ත්‍රයෙහි කෙළ පැමිණියකු බව." සුභ සහ යස නාට්‍යයේ එන මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) සුභ (2) යස (3) මහ ඇමති
(4) නිර්මලා (5) තුන්වැනි ඇමති (.........)

**29.** සුභ ගේ කුමන්ත්‍රණය අනාවරණය වීමෙන් පසු යස ඔහුට ලබාදුන් දඬුවම වන්නේ,
(1) ගෙළ සිඳ මරණයට පත් කිරීමට නියෝග කිරීම
(2) රාජ්‍යයෙන් පිටුවාහල් කිරීම
(3) තමා ගේ සිහසුනේ හිඳ රට පාලනය කිරීමට නියෝග කිරීම
(4) ඒ මොහොතේ ම සිය ඔටුන්න ගලවා සුභට පැළඳවීම
(5) සම්මාන පිදීමට විශේෂ රාජසභා වාරයක් කැඳවීම (.........)

**30.** "සදා සුන්දර රූ සපුවකින් - යුතු වුවත් මානයක් නම් නැති
කථා බහට ද හුරු බුහුටි මුව - වාදයට කිසිසේත් නොකැමති ......"
ඔතෙලෝ නාට්‍යයේ අන්තර්ගත ඉහත සංවාද ඛණ්ඩය කවුරුන් විසින් කියන ලද්දක් ද?
(1) ඔතෙලෝ (2) රොඩ්‍රිගෝ (3) කැෂියෝ
(4) එමිලියා (5) ඉයාගෝ (.........)

[පස්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**31.** ඔතෙලෝ නාට්‍යයේ ඩෙස්ඩිමෝනා ගයන විලෝ ගීතය ඇය පවසන පරිදි ඊට පෙර කවරකු විසින් ගයන ලද්දක් ද?

(1) බාබරා නම් සේවිකාව (2) ඩෙස්ඩිමෝනා ගේ මව (3) ඔතෙලෝ
(4) බියන්කා (5) බ්‍රබැන්ෂියෝ (.........)

**32.** ඔතෙලෝ නාට්‍යයේ ප්‍රථම අංකයට පසුබිම් වන ස්ථානය කුමක් ද?

(1) තුර්කිය (2) සයිප්‍රසය (3) වෙනීසිය
(4) ඊජිප්තුව (5) ෆ්ලොරන්සය (.........)

**33.** "'ඔව් එය නිසැකමයි, මරණ දෙකක ම මහ බර ඔබ මත ම පැටවෙයි මහරජ' එය විය අවසන් වදන් ඇගේ"
ඇන්ටිගනී නාට්‍යයේ සඳහන් ඉහත සංවාද ඛණ්ඩය කවුරුන් විසින් පවසන ලද්දක් ද?

(1) ක්‍රියෝන් (2) පණිවුඩකරු (3) ගායන වෘන්දය
(4) හීමන් (5) ටෙරේසියස් (.........)

**34.** ඇන්ටිගනී නාට්‍යයේ පළමු අංකය ආරම්භයේ වේදිකාවට පිවිසෙන ගායන වෘන්දය විස්තර කරන්නේ කුමක් පිළිබඳ ව ද?

(1) ඊඩිපස් රජු පිටුවහල් වූ අයුරු
(2) ඇන්ටිගනී රජ අණට අකීකරු වූ අයුරු
(3) තීබය නැසීමට ආ පරසතුරු සේනා ගැන
(4) තීබයට එළඹීමට නියමිත විපත ගැන
(5) නව රජු වූ ක්‍රියොන්ගේ පාලනය ගැන (.........)

**35.** අභිඥානශාකුන්තලයේ මාරීච ඍෂිවරයා ගේ ආශ්‍රමය පිහිටා ඇත්තේ කොහි ද?

(1) සෝම තීර්ථයේ (2) මාලිනී නදිය අසබඩ
(3) ස්වර්ගයේ (4) හේමකූටයේ
(5) හස්තිනාපුරයේ (.........)

**36.** අභිඥානශාකුන්තලයේ දුෂ්‍යන්ත රජු අයත් වන්නේ කුමන රාජවංශයට ද?

(1) ඉක්ෂ්වාකු වංශය (2) චන්ද්‍රවංශය (3) මෞර්යවංශය
(4) භරතවංශය (5) පුරුවංශය (.........)

**37.** ජූලියස් සීසර් නාට්‍යයේ බ්‍රූටස්ට දිවි නසාගනු පිණිස අසිපත දරාසිටියේ,

(1) ස්ට්‍රාටෝ ය. (2) ලුසිලියස් ය. (3) මෙසාලා ය. (4) ක්ලීටස් ය. (5) පින්ඩාරස් ය. (.........)

**38.** "දුෂ්ටයෙනි, තොපි ඇනපු කිනිසි සීසර්ගේ ශරීරෙ ඇතුළේ දී එකට ගැටෙන හඬ ඇසෙනතුරුම තොපි ඒ වගේ අනතුරු ඇඟවීමක් කළේ නැහැ."
ජූලියස් සීසර් නාට්‍යයේ එන ඉහත සංවාද ඛණ්ඩය කවුරුන් විසින් පවසන ලද්දක් ද?

(1) ඔක්ටේවියස් (2) ඇන්ටනි (3) ලෙපිඩස්
(4) ක්ලෝඩියස් (5) සින්නා (.........)

**39.** "පුහ් ඃ එනවා මාව බය කරන්න! මම එච්චර මෝඩ නැහැ. නමුත් ......? නැහැ, නමුත්...... ඒක එහෙම වෙන්න බැහැ! මම එහෙම කෙරුවෙ ආදරය වෙනුවෙන්"
රූකඩ ගෙදර නාට්‍යයේ එන ඉහත සංවාද ඛණ්ඩය කවුරුන් විසින් පවසන ලද්දක් ද?

(1) ලින්ඩ මහත්මිය (2) නූවුරා (3) රන්ක් (4) හෙල්ම (5) ක්‍රෘග්ස්ටඩ් (.........)

**40.** රූකඩ ගෙදර නාට්‍යයේ නූවුරා සිය තරන්තලා නැටුම සඳහා අතට ගන්නා වාද්‍ය භාණ්ඩය කුමක් ද?

(1) අත් රබාන (2) සීනුව (3) ඩොලැක්කිය
(4) තැම්බුරීනය (5) අත් බෙරය (.........)

* *

[හයවැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

නාට්‍ය හා රංග කලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

## II කොටස

**උපදෙස්:**

✳ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

### A - දේශීය නාට්‍ය කලාව

**1.** (i) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වී ඇති ප්‍රකට පරිවර්තන නාට්‍ය **දෙකක්** නම් කොට ඒවායේ මුල් නිර්මාණකරුවන් හා මුල් නාම සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඉහත (i) හි සඳහන් කරන ලද **එක්** නාට්‍ය නිෂ්පාදනයක මුල් නිර්මාණකරුවා හා පරිවර්තකයා පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) ඉහත (i) හි සඳහන් කරන ලද නාට්‍ය **දෙකින් එකක** ශ්‍රී ලාංකේය නිෂ්පාදනය පිළිබඳ විචාරයක් කරන්න. (ලකුණු 06 යි.)

**2.** (i) 'සුභ සහ යස' නාට්‍යයේ යසලාලකතිස්ස රජු ප්‍රශස්ති ගායනා ඇසීමට රුචියක් **නොදක්වන්නේ** මන්දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(ii) ප්‍රශස්ති ගායන රජුට හිරිහැරයක් නොවන ලෙසත්, චාරිත්‍ර රැකෙන ලෙසත් පවත්වාගැනීම පිණිස සුභ දෙන උපදේශය කුමක් ද? (ලකුණු 05 යි.)

(iii) රජුට උපදෙස් දී රජු ගේ සිත දිනාගැනීමෙන් සුභ සපුරාගැනීමට උත්සාහ කරන යටි අරමුණු පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

**3.** (i) "හස්තිකාන්ත මන්තරේ " නාට්‍යයේ I අංකයේ පළමු ජවනිකාවේ පෙනීසිටින පාත්‍රයන් නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) "හස්තිකාන්ත මන්තරේ" II අංකයේ තෙවැනි ජවනිකාවේ ආරම්භයේ උදයන රජු ඇතා පසුපස යන ආකාරය විස්තර කොට ඇත්තේ කෙසේ දැ යි පහදන්න. (ලකුණු 05 යි.)

(iii) උදයන රජු ගයන හස්තිකාන්ත මන්තරය ලියා දක්වා, ඒ පිළිබඳ රස විඳීමක් කරන්න. (ලකුණු 06 යි.)

### B - විදේශීය නාට්‍ය කලාව

**4.** (i) ජුලියස් සීසර් ගේ ඝාතකයන් අතුරෙන් **සිව් දෙනකු ගේ** නම් සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ජුලියස් සීසර් නාට්‍යයේ කූටප්‍රාප්ති අවස්ථා **දෙක** පැහැදිලි කොට දක්වන්න. (ලකුණු 05 යි.)

(iii) දෙවන කූටප්‍රාප්ති අවස්ථාවෙන් පසු සීසර් ඝාතනය කළ කුමන්ත්‍රණකරුවන්ට සිදු වන්නේ කුමක් දැ යි විස්තර කරන්න. (ලකුණු 06 යි.)

**5.** (i) 'ඇන්ටිගනී' නාට්‍යයේ ගැටුමට තුඩුදුන් ඊඩිපස් රජු ගේ මියගිය පුතුන් **දෙදෙනා ගේ** නම් සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

(ii) එම පුතුන් දෙදෙනා ගේ අවමංගල්‍ය පිළිබඳ ව ඇන්ටිගනී ගේ මතයට පක්ෂ ව හීමන් නගන තර්ක පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iii) තීබයට උදා වූ තත්ත්වය විමසීමට දෙවොලට ගොස් පැමිණෙන අනාගතවක්තෘ ටෙරේසියස් බිලිපූජාවේ ප්‍රතිඵලය පිළිබඳ ව පවසන දැ විස්තර කරන්න. (ලකුණු 06 යි.)

**6.** (i) 'රූකඩ ගෙදර' නාට්‍යයේ රංග විධාන අනුව ආරම්භක දර්ශනයේ වේදිකාව මත තැබිය යුතු නාට්‍යෝපකරණ **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) එම නාට්‍යයේ නූවුරා ටෝවල්ඩ් හෙල්ම ගෙන් වසන් කරගෙන සිටින රහස කුමක් දැ යි දක්වා එසේ සඟවා සිටීමට හේතුව කුමක් දැ යි පහදන්න. (ලකුණු 05 යි.)

(iii) රහස අනාවරණය වීමෙන් පසු රූකඩ ගෙදරට උදා වූ තත්ත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

✳ ✳ ✳

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk

agaram.lk